## 1.1 හැඳින්වීම

නවීන සමාජයක ජනමාධ්‍ය විසින් ඉටුකරනු ලබන කාර්ය භාරය බෙහෙවින් වැදගත්ය. විශේෂයෙන්ම, ගෝලීයකරණ ක්‍රියාවලියට හසුවූ ලෝකයක, ලෝකයේ ඕනෑම තැනක සිදුවන සිදුවීම් විස්තරාත්මකව සහ ඉක්මනින් සමස්ත ලෝක ජනතාවටම ජනමාධ්‍ය හරහා ලබාගැනීමට හැකිය. ජනමාධ්‍ය ජාත්‍යන්තර තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහ එම තීරණයන්ට පොදු අභිමතයක් ලබාගැනීමේදී ජනමාධ්‍ය වල වැදගත්කම පෙන්නුම් කරන උදාහරණයක් ලෙස දැක්විය හැක්කේ, විවිධ සිද්ධීන් සාකච්ඡා කිරීමේදී සී.එන්.එන්. සාධකය ගැන කරන අවධාරණයයි. ජනමාධ්‍ය මඟින් ජාත්‍යන්තර වශයෙන් බෙහෙවින් වැදගත් වන කරුණු සම්බන්ධයෙන් ලෝක මතයක් ඇති කිරීමට අරමුණ කර ගනී. අද ජනමාධ්‍ය සහ එහි භාවිතය පසුගිය සියවස් දෙක, තුන තුළ ක්‍රමානුකූල විකාශනයක ප්‍රතිඵලයකි. එමනිසා ජනමාධ්‍යයේ විකාශනය සහ සංවර්ධනය නූතනත්වය සමඟ ඇරඹෙන සංවර්ධන ක්‍රියාවලිය සමඟ ආසන්න ලෙස බද්ධ වේ. කාර්මික විප්ලවයට පසු බෙහෙවින් අවධාරණය කෙරුණු කරුණක් වූයේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ ඇතිවූ පරිවර්තනයට සමාන්තරව හා ඊට සමාන වේගයකින් පරිවහන සහ පණිවිඩ හුවමාරු ක්ෂේත්‍රයේ වෙනස්කම් සිදු නොවීමයි. පරිවහන සහ පණිවුඩ හුවමාරු ක්ෂේත්‍රයේ සංවර්ධනය නිෂ්පාදන සංවර්ධන වේගයට සමාන නොවීම නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි ඊළඟ පියවර තැබීමටද බාධාවක් විය. මේ නිසා 19 වන ශත වර්ෂයේ මැද භාගයෙන් පසු නූතනත්ව ක්‍රියාවලිය වඩා වේගවත් ලෙස පරිවහන ක්ෂේත්‍රයේත් ඊට පසුව සන්නිවේදන ක්ෂේත්‍රයේත් දිග හැරෙනු දැකගත හැක. බොහෝ විද්වතුන් සඳහන් කරන පරිදි කාර්මික විප්ලවය එහි දෙවැනි අදියරට ගමන් ගත්තේ දුම්රිය පරිවහන ක්ෂේත්‍රයේ ඇතිවූ වර්ධනය සමඟය. මේ නිසාම කාර්මික සංවර්ධනය කුඩා පරිමාණ ලුහු කර්මාන්ත වෙතින් විශාල පරිමාණ බැර කර්මාන්ත වෙත යොමු වීමක් දැකගත හැක. එම තේරුමෙන් ගත් විට සංවර්ධන ක්‍රියාවලිය සෑම විටම හා සෑම තැනම සිදුව ඇත්තේ විවිධ ක්ෂේත්‍රයන්හි ඇතිවන අසමාන සංවර්ධනයන්හි ප්‍රතිඵලයක් සහ එම අසමාන සංවර්ධන ගැටලුව විසඳා ගැනීමට ගනු ලබන උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙසය.

දෙවනුව ජනමාධ්‍යයෙහි වර්ධනය දේශපාලන හා සමාජයීය වශයෙන් ද කැපී පෙනෙන හා වැදගත් ප්‍රතිඵලයක් වේ. බෙනඩික් ඇන්ඩර්සන් (1990) ට අනුව සාමූහිකයක් ලෙස "ජාතිය" යන්න, පරිකල්පනය කිරීමට ඉඩකඩක් සැලසුනේ මුද්‍රිත ධනේශ්වර ක්‍රමයේ වර්ධනයත් සමඟ සහ එහි ප්‍රතිඵලයක් ලෙසය.

මුද්‍රිත ධනවාදයට පෙර බොහෝ රටවල පැවතුණේ ඒ ඒ ප්‍රදේශ වලට සීමා වූ කතා කරන භාෂාවක් හා ජනවහරක් පමණි. යුරෝපයෙහි සමාජ ප්‍රභූන් යොදා ගනු ලැබුවේ බොහෝ විට රෝම හා ග්‍රීක භාෂාවයි. එවන් තත්ත්වයක් තුළ භාෂාව බෙහෙවින් වැදගත් වේ. "ජාතියක්" යන සාමූහිකත්වයක් ගොඩනැගීම දුෂ්කරය. නමුත් මුද්‍රණ ශිල්පයේ දියුණුවීමත්, මුද්‍රණ යන්ත්‍ර වල සොයා ගැනීම හා විකාශනයත් සමග විශාල පිරිසකට නිෂ්පාදනය කෙරෙන ග්‍රන්ථ සහ පුවත්පත් පරිහරණය කළ හැකි වූයේ එම ලියවිලි වලට පොදු භාෂාවක් තේරුම් ගත හැකි පාඨක සමූහයක් සිටීමෙන් පමණි. මේ අනුව ඇන්ඩර්සන් පෙන්වා දෙන්නේ, මුද්‍රිත ධනවාදයේ බිහිවීමත් සමග විශාල භූමි භාගයක ජීවත් වන ජනකොටසකට තමනට පොදු අනන්‍යතාවක් ඇත්තේය යන්න පරිකල්පනය කිරීමට වාතාවරණයක් බිහිවීමයි. මේ අනුව නූතනත්ව ක්‍රියාවලියේ ප්‍රධාන අංගයක් වන ජාතික රාජ්‍ය බිහිවීමේදී මුද්‍රණ කර්මාන්තයෙහි පැන නැගීමත්, ඒ සමග ඇතිවූ පුවත්පත් හා සඟරා වල ප්‍රචලිත වීමත්, බලපෑ බව පෙනේ.

තුන්වෙනුව, මාධ්‍ය පවත්නා ආයතන රටාව හා සම්බන්ධතා පද්ධතීන්ද සමාජයේ පවතින අධිපති දෘෂ්ටිවාදයන් තහවුරු කිරීමට සහ ආරක්ෂා කිරීමට ක්‍රියාත්මක වන බව දැක්විය හැක. ඉතාලි ජාතික මාක්ස් වාදියෙකු වන අන්තෝනියෝ ග්‍රාම්ස්චි (1976) පෙන්වා දෙන පරිදි, "සිවිල් සමාජය" යන අදහස මෙහිදී නව ආලෝකයක් සපයන්නේය. නවීන රාජ්‍යයකට දණ්ඩ බලය මගින් පමණක් තම පුරවැසියන් හැසිරවීම අසීරුය. දණ්ඩ බලය පමණක් ප්‍රධාන වූ රාජ්‍ය සැබවින්ම දුර්වල බව ග්‍රාම්ස්චි පෙන්වා දෙයි. නමුත් රාජ්‍යයෙහි පැවැත්ම තමන්ට අවශ්‍ය වන බවත් එම රාජ්‍ය තමන් වෙනුවෙන් පෙනී සිටින බවත් එය තමන් නියෝජනය කරන බවත් පුරවැසියන් විසින් පිළිගනු ලබන්නේ නම් එය රාජ්‍යයේ පැවැත්ම වඩාත් ශක්තිමත් කරයි. ආධිපත්‍ය පවත්වා ගැනීමට උදව් වන මෙම ක්‍රියාදාමය හැඳින්වීමට "හෙජමනිය" යන වචනය ග්‍රාම්ස්චි යොදා ගනු ලබයි. සිවිල් සමාජයේ ආයතන සහ සබඳතාවන් ඉටුකරනු ලබන්නේ මෙම ආධිපත්‍ය තත්ත්වය පවත්වා ගැනීමට ආධාර කිරීමෙනි. අප පසුව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන හර්මන් සහ චොම්ස්කි විසින් ඉදිරිපත් කරනු ලැබූ ප්‍රචාරණ ආදර්ශය විසින් පෙන්නුම් කරන්නේ ජනමාධ්‍ය මගින් එම හෙජමනි තත්ත්වය ඇති කිරීම ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්නයි. මේ නිසාම ජනමාධ්‍ය අපක්ෂපාත හා විෂය බද්ධ තොරතුරු ඉදිරිපත් කරන්නන් ලෙස පමණක් දැක්වීමට නොහැකි වේ. ජනමාධ්‍ය වල පවත්නා දෘෂ්ටිවාදයන් හා සංස්ථා පද්ධතීන් තහවුරු කිරීමට හා ආරක්ෂා කිරීමට ජනමාධ්‍යයන් දායක වුවද ජනමාධ්‍ය විසින්

පුරවැසියන්ට ධනාත්මක මෙහෙයක් සිදු නොවෙතැයි මෙයින් අදහස් නොවේ. ජනමාධ්‍ය වල ශක්තිය සහ ජනමාධ්‍ය වලට ඇති නිදහස ස්වභාවික ව්‍යසනයන් දුර්වල කිරීමට සහ එවන් ව්‍යසන තත්ත්වයකදී එයට මුහුණ දෙන ජනතාවට සහන සැලසීමට බොහෝ සෙයින් උදව් වන බව, සාගත පිළිබඳ කළ අධ්‍යයනකදී අමර්ත්‍යා සෙන් විසින් පෙන්වා දී ඇත. සෙන් පෙන්වා දෙන්නේ සීමිත සහ නොනිදහස් මාධ්‍ය භාවිතය සාගත වල පැන නැගීමට බොහෝ දුරට හේතුවූ බවයි. සෙන් (2003) ට අනුව සාගතයක් ඇති වන්නේ ආහාර නිෂ්පාදනයේ ඇති අප්‍රමාණවත් බව නිසා නොව ආහාර නිෂ්පාදනය වන සහ ආහාර හිඟ ප්‍රදේශ අතර නිසි සම්බන්ධයක් ඇති කිරීම අසමත් වන නිසාය. බ්‍රිතාන්‍ය විජිත සමයේදී, බෙන්ගාල සාධකය පිළිබඳ විවරණයක් කළ හේ මෙය කදිමට පෙන්වා දේ. නිදහස ලැබීමෙන් පසු වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී මාධ්‍ය භාවිතයක් ඇති වීම නිසා සාගතයන් මඟහරවා ගැනීමට ඉන්දියාවට හැකි වූ බව සෙන් පෙන්නුම් කළේය.

මෙම සාකච්ඡාවෙන් පෙන්නුම් කෙරෙන්නේ මාධ්‍ය පිළිබඳ කරනු ලබන විශ්ලේෂණයන් මාධ්‍යයේ විවිධ මානයන් අවධාරණයට ලක් කළ යුතු බවයි. අර්ධ සංවර්ධිත රටවල මාධ්‍ය හැසිරවීම සහ භාවිතය කිසියම් ප්‍රමාණයක අර්ධ සංවර්ධිත භාවය මඟින් තීරණය කරනු ලැබේ. අනෙක් අතට අර්ධ සංවර්ධිත භාවය පිළිබඳ ප්‍රශ්න මාධ්‍ය මඟින් අවධාරණය කිරීමෙන් සහ පෙන්වා දීමෙන් අර්ධ සංවර්ධිත භාවය විවිධ මානයන් සහ පැතිකඩ වලින් පුරවැසියන් තුළ පුළුල් අවබෝධයක් ඇති කිරීමට හේතු වන්නේය. සංවර්ධිත රටවල මාධ්‍ය භාවිතය ගැන විවිධ අධ්‍යයනයන් කෙරී ඇති අතරම එම අධ්‍යයනයන් මාධ්‍ය භාවිතය හැසිරවීමේ විවිධ පැතිකඩ ගැන සාකච්ඡා කරයි. එසේ වුවද මාධ්‍ය භාවිතය සහ හැසිරවීම අර්ධ සංවර්ධිත සන්දර්භයේ සිදුවන්නේ කෙසේද? අර්ධ සංවර්ධිත භාවය මාධ්‍ය හැසිරවීම හා භාවිතය කෙරෙහි කුමන සංරචකයන් ඇති කරන්නේද? අර්ධ සංවර්ධිත භාවය මාධ්‍ය හැසිරවීම සහ භාවිතය තුළ කුමන අයුරකින් උත්ප්‍රේෂණය වන්නේද ? යන ප්‍රශ්නයන් පිළිබඳ කෙරී ඇති අධ්‍යයනයන් ද, අප්‍රමාණවත්ය. එබැවින් සමාජයීය ඌන සංවර්ධනය ගුවන් විදුලි ප්‍රවෘත්ති තුළ නිරූපණය වන ආකාරය සොයා බැලීම කාලීන අවශ්‍යතාවයක් යැයි සිතමි.